# ඔබට තොරතුරු අවශ්‍යද?

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මකයි.

පනත යටතේ පොදු අධිකාරීන්ට අයත් ආයතනයන්ට අදාළ තොරතුරු ලබා ගැනීමට දැන් හැකියාව ඇත. ඒ සඳහා අදාල ආයතනයේ තොරතුරු නිලධාරියා වෙත RTI 01 දරණ අයදුම්පත්‍රය මගින් අයදුම් කල හැකිය. (මෙම අයදුම්පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය පිළිගැනීමේ අංශයෙන් හෝ අන්තර්ජාලය ඔස්සේ හෝ ලබා ගැනීමේ හැකියාව ඇත.)

ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පහත සඳහන් නිලධාරියා වෙත අයදුම්පත්‍රයක් යොමු කිරීමෙන් ඇල්පිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලයට අදාලව ඇති තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.

තොරතුරු නිලධාරියා- ඒ.ඩබ්.ටී. අබේවර්ධන මහත්මිය,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්පිටිය.
දුරකථන අංකය 091-2291144
ජංගම දුරකථන අංකය **071-8212455**

1. තොරතුරු ලබාගැනීම සඳහා ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක්, තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුනු බවට, RTI 02 ලිපිය ලබා ගන්න.

2. ඔබේ ඉල්ලීමට අදාල තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මණින් හෝ දින 14ක් තුළ දන්වනු ලැබේ.

3. ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණය කළහොත් කොමිසන් සභාව නියම කල ගාස්තුවක් ගෙවිය යුතු නම් එය ඔබට දන්වා එවනු ඇත.තොරතුරු ලබා ගැනීමට ගෙවීමක් කල යුතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14 ක් තුළ තොරතුරු ලබා දෙනු ඇත.

4. ගාස්තු ගෙවීමෙන් පසු, දින 14ක් තුළ තොරතුරු ලබා දීමට අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින්, දින 21 කට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.

5. තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම, යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම, ඉල්ලීම ලැබී පැය 48 ක් තුළ සිදු කරනු ඇත.

6. තොරතුරු ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාළව,
   (i) තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක්, භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම,
   (ii) පනතේ 5 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම,
   (iii) පනත මගින් නිශ්චිතවම දක්වා ඇති කාල සීමාවන්ට අනුකූල නොවීම,
   (iv) සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම,
   (v) වැඩිපුර ගාස්තු අය කිරීම,
   (vi) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීම, නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම,
   (vii) එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘති කර, විනාශ කර හෝ අස්ථාන ගත කර ඇති බවට, තොරතුරු ඉල්ලා සිටින පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම,

යන කරුණු මත ඉල්ලුම්කරු අතෘප්තියට පත්වන්නේ නම් පහත සඳහන්, නම් කල නිලධාරියා වෙත දින 14 ක් තුළ අභියාචනයක් ඉදිරිපත් කරන්න.

සුසීමා කාරියවසම් මහත්මිය,
(අභියාචනා නිලධාරී/නම්කල නිලධාරී)
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇල්පිටිය.
දුරකථන අංකය **091-2291418/ / 0718361834**

තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාව,
කාමර 203,204,
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
Tel :- 011-2691625
Email – rti.commission16@gmail.com / web – www.rticommission.lk